www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# රියෝ ටින්ටෝ-චිනල්කෝ ගිවිසුම බිඳවැටෙයි

**Rio Tinto-Chinalco deal collapses**

**ජෝන් චාන් විසිනි**

**2009 ජූනි 23**

ඇන්ග්ලෝ-ඔස්ට්‍රේලියානු පතල් කැනීමේ යෝධයෙකු වන රියෝ ටින්ටෝ, එහි එක්සත් ජනපද ඩොලර් බිලියන 19.5 ක ආයෝජනයක් කිරීමට නියමිතව සිටි චීන ඇලුමිනියම් සංස්ථාව (චිනල්කෝ) සමඟ පැවති අර්බුදකාරී ගිවිසුම අතහැර දමා ඒ වෙනුවට ඕස්ට්‍රේලියානු බීඑච්පී බිලිටන් සමාගම සමඟ සන්ධානයකට එළඹි බව නිවේදනය කලේය. ගෝලීය මිල ගනන් මත පහලට නැඹුරු පීඩනයට මුහුන දියහැකි පරිදි, කේවෙල් කිරීමේ ශක්තිමත් තත්වයක් ගොඩනගා ගැනීමටත්, වියදම් කැපීමටත්, රියෝ-බීඑච්පී හවුල්කාරිත්වය බටහිර ඕස්ට්‍රේලියාවේ පිල්බරා ප්‍රදේශයෙහි බිලියන 116 ක යපස් නිධි සඳහා හවුල් ව්‍යවසායක් නිර්මානය කරනු ඇත.

ජූනි 5 දින නිවේදනය, විශේෂයෙන්ම දුෂ්කර සටනක නියැලී සිටින චීන වානේ කර්මාන්තයට මෙන්ම එහි නිෂ්පාදන කර්මාන්තයට අත්‍යවශ්‍ය ඛනිජ සැපයුම ස්ථාවර කර ගැනීමෙහිලා බීජිනයේ සැලසුම් වලට එල්ල වූ තදබල පහරක් විය. චීන, ජපන් හා යුරෝපා සංගමයේ වානේ සංගතයන් මෙන්ම ලෝක වානේ සම්මේලනය ද යන සියල්ල, රියෝ-බීඑච්පී සාමුහිකය ඒකාධිකාරී යයි ප්‍රසිද්ධියේම එයට සිය විරෝධය පලකොට තිබේ. පතල්කරුවන් දෙදෙනාගේ ම ඒකාබද්ධ වාර්ෂික යපස් නිෂ්පාදිතය ටොන් මිලියන 270 ක් පමන වේ. ඒ සමඟ බ්‍රසීලයේ වේලි සමාගම ද එක්ව ගත් කල ඔවුන් ලෝක යපස් වෙළඳමෙන් සියයට 70 කට වග කියයි. විශාලතම ජාත්‍යන්තර වානේ නිෂ්පාදකයා ලෙස චීනය, ගෝලීය සැපයුමෙන් අඩකටත් වැඩි ප්‍රමානයක් පරිභෝජනය කරයි.

රියෝ හා බීඑච්පී, ජපාන හා දකුනු කොරියානු වානේ සමාගම් සමඟ මෙම වසරේ යපස් මිල ගනන් ටොන් එකක් ඩොලර් 61 ක් වන පරිදි සියයට 33 කින් පහත හෙලීමට මැයි මාසයේ දී ගිවිසුමකට එළඹුනාහ. කෙසේ වුව ද චීන වානේ සමායතනය සියයට 40-45 අතර ප්‍රමානයකින් මිල පහත හෙලීමට බලකරමින් සාකච්ඡාවලින් ඉවත්ව යන බවට තර්ජනය කර තිබේ. චීන පියවර, වසර සඳහා පාදකය ලෙස මිල ගනන් ගිවිසගන්නා වාර්ෂික සාකච්ඡා වටයේදී ඇතිකර ගන්නා පලමු එකඟත්වය පිලිගන්නා, කර්මික සම්ප්‍රදාය බිඳ දැමීමක් විය.

චීනය තුල ව්‍යාපාරික කටයුතුවල යෙදීමට පූර්වයෙන්, ප්‍රති ඒකාධිකාරී නියාමන අනුමැතිය ලබාගැනීමේ අවශ්‍යතාවය ඉදිරිපත් කරමින්, බීඑච්පී හා ටින්ටෝ සමාගම් වලට එරෙහිව ප්‍රති ප්‍රහාරාත්මක පියවර ගන්නා බවට බීජිනය තර්ජන එල්ල කොට තිබේ. යුරෝපීය හා ජපන් වානේ නිෂ්පාදකයන් ද, යපස් සන්ධානය, ප්‍රති-භාරකාර නියාමනයන් උල්ලංඝනය කොට ඇත්දැයි පරීක්ෂන පවත්වන බවට තර්ජනය කර ඇත. ලෝක වානේ කර්මාන්තයේත් පොදුවේ නිෂ්පාදන කර්මාන්තයේත් ගැඹුරු වන අර්බුදය, මෙම තර්ජන පිටුපස පවතින අතර, මිල ගනන් මත පතල්කරුවන් හා නිෂ්පාදකයන් අතර තියුනුවන ගැටුමක් මේ තුලින් නිර්මානය කර තිබේ.

චිනල්කෝ, රියෝ සමඟ ඇති කර ගත් ගිවිසුම, භාන්ඩ උත්පාතයේ බිඳ වැටීමෙහි නිමැවුමකි. 2007 වසරේ දී ඛනිජ සඳහා ඉල්ලුම තවමත් ඉහල නගිමින් පවතිද්දී, ලෝකයේ වඩාත්ම බලගතු පතල් සමාගම නිර්මානය කිරීමේ අරමුන ඇතිව බීඑච්පී, රියෝ සඳහා ඩොලර් බිලියන 135 ක සතුරු අත්පත්කර ගැනීමේ ලන්සුවක් දියත් කලේය. මිල පහල මට්ටමක පවතින තතු හමුවේ රියෝ, අත්පත්කර ගැනීමට ප්‍රතිරෝධය දැක්වූ අතර, ප්‍රධාන කැනේඩියානු ඇලුමිනියම් සමාගමක් වන ඇල්කැන් මිලට ගත්තේය. චීනයේ රාජ්‍ය පරිපාලිත වානේ සමාගම් වෙනුවෙන් කටයුතු කරමින් චිනල්කෝ, රියෝහි කොටස් වලින් සියයට 9 ක් මිලට ගත් අතර එහි විශාලතම කොටස්හිමියා බවට පත්වූයේ, ඉහත කී අත්පත්කර ගැනීම අත්හිටුවීමට සහාය දක්වමිනි.

පසුගිය වසරේ භාන්ඩ මිල ගනන් කඩා වැටීමෙන් පසුව රියෝ, 2009 වසරේ ඔක්තෝබරයේ ආපසු ගෙවීමට නියමිත බිලියන 8.9 ක් ද ඇතුලු බිලියන 40 කට ආසන්න නයක සිරවී සිටියේ ය. එම නයට කරගැසීමට අකැමතිවූ බීඑච්පී සිය අත්පත්කර ගැනීමේ වැඩ සටහන අතහැර දැමූ අතර, ගෝලීය නය අර්බුදය මධ්‍යයේ රියෝ, ප්‍රාග්ධනය සොයා දස අතේ දුවන තැනට ඇද දැමීය. පහල ව්‍යාපාර වස්තු මිල ගනන්වල

වාසිය ලබාගැනීම සඳහා බීජිනය දියත්කල ''ගෝ ග්ලෝබල්'' (ගෝලීය වන්න) ආයෝජන ව්‍යායාමයේ කොටසක් ලෙස චිනල්කෝ, වැඩි කොටස් ප්‍රමානයක හා හවුල් ව්‍යාපාරික කටයුතුවල යෙදීමේ අයිතියට හිලව් වශයෙන් ඩොලර් බිලියන 20 පමන රියෝ්හි ආයෝජනය කිරීම සඳහා එම සමාගම සමග ගිවිසුමකට එලඹුනේ ය.

කෙසේ වුව ද සාධක ගනනාවක් එම සැලැස්මට එරෙහිව ක්‍රියාත්මක විය. චීන ආන්ඩුවේ දේශීය උත්තේජක වැඩ සටහන කෙටි කාලීනව වානේ සඳහා ඉල්ලුමක් ජනනය කලේය. එමගින් එම ක්ෂේත්‍රයෙහි අමුද්‍රව්‍ය ගොඩගසා ගැනීමටත්, සමපේක්ෂකයන්ට ටොන් මිලියන ගනන් යපස් තොග රැස්කිරීමටත් ආවේශයක් සැපයීය. පාරිභෝගික භාන්ඩ මිල තාවකාලිකව ඉහල නැඟීමෙන් රියෝ සඳහා හුස්ම ගැනීමේ ඉඩක් විවෘත විය. ඊට අමතරව, චිනල්කෝ සිය බලය යපස් මිල කෙරෙහි බලපෑම් කිරීම සඳහා යොදාගනිතැයි කලබලයට පත් කොටස් හිමියන් වෙතින් කලමනාකාරිත්වයට දැඩි බලපෑම් එල්ල වීමට පටන් ගත්තේය.

අප්‍රේල් මාසයේ දී රියෝහි නව සභාපති ජෑන් ඩියු ප්ලේසිස් චිනල්කෝ ගිවිසුම අතහැර දැමීමට තීරනය කරමින්, බටහිර ඕස්ට්‍රේලියාවේ යපස් නිෂ්පාදනය බීඑච්පී සමග ඒකාබද්ධ කිරීමේ සැලැස්මක් පිලිබඳව රහසිගත සාකච්ඡා ආරම්භ කලේය. එහි අරමුන, ඔවුන්ගේ ඒකාබද්ධ කේවෙල් කිරීමේ ශක්තිය නංවා ගැනීමයි. රියෝ තම නයෙන් කොටසක් ගෙවීම සඳහා බිලියන 15.2 ක් වටිනා නව කොටස් කිකුත් කිරීමටත්, බීඑච්පී රියෝට වඩා අඩු යපස් ප්‍රමානයක් නිෂ්පාදනය කරද්දී පවා, ඔවුන් ඒකාබද්ධ ව්‍යාපාරික කටයුතු පනහට පනහ ලෙස බෙදාගැනීමේ පංගුව වශයෙන්, අතිරේක ඩොලර් බිලියන 5.8 ක් ගෙවීමටත්, එකඟ විය. මේ සියල්ල හොර රහසේ සිදුවෙමින් තිබෙන අතර රියෝ, සිය මුල් සාකච්ඡාව චිනල්කෝ සමග තවමත් පවත්වාගෙන ගියේ මූනිච්ඡාවටය.

තමන්ට කොකා පෙන්වීම පිලිබඳව බීජිනයේ කෝපය ප්‍රසිද්ධියේ ම උතුරා ගියේය. නිල *ශින්හුවා* ප්‍රවෘති සේවය, රියෝ ටින්ටෝ විස්තර කලේ, චිනල්කෝහි මුදල් පසුපස වැටුනු ''වංචනික කාන්තාවක්'' ලෙසය. අතිශය පීඩාකාරී මූල්‍ය අර්බුදයෙන් රියෝ ටින්ටෝ ගොඩ ඒමෙන් පසුව, *ශින්හුවා* කියා සිටියේ ''ඇය විශ්වාසය කඩකරමින් ඉනිමගට පයින් ගැසූ'' බවයි. *ශින්හුවා*, ආධුනික ගෝලීය ආයෝජකයන් වන චීන සමාගම් වලින් ඉල්ලා සිටියේ, කිසිවෙකුත් ලාබෙට විශ්වාස නොකරන ලෙසයි. ජාත්‍යන්තර රාජ්‍ය තාන්ත්‍රිකයේ ප්‍රකාශිතව ඇති ආප්තෝපදේශය වනාහි ''ජාත්‍යන්තර ගනුදෙනුවල දී පවතින්නේ එක් නීතියක් පමනි. එනම්, සදාතනික මිත්‍රත්වයක් නැත. ඇත්තේ සදාතනික ලාභය පමනි.'' යනුවෙන් එය ප්‍රකාශ කලේය.

චිනල්කෝ ගිවිසුමේ බිඳ වැටීම, ඕස්ට්‍රේලියානු ලේබර් ආන්ඩුවට දේශපාලන සැනසුමක් ගෙන ආවේය. රජය සතු චීන සමාගමකට මුලෝපායික පතල් සම්පත් අත්කර ගැනීමට ඉඩ නොදිය යුතු යයි, වෘත්තීය සමිති නිලධරයෙන් ද විරුද්ධ පක්ෂ දෙශපාලඥයන්ගෙන් ද ව්‍යාපාරිකයන්ගෙන් ද පලවූ වැඩෙන ආරක්ෂනවාදී ඝෝෂාවට අගමැති කෙවින් රඩ් මුහුනපා සිටියේය. චිනල්කෝ ගිවිසුමට විරුද්ධවූ මිලිටරි සංස්ථාපිතයේ කොටස් ද අනතුරු ඇඟවූයේ, එය එක්සත් ජනපදය සමග ඕස්ට්‍රේලියාවට ඇති දිගුකාලීන ඇන්සුස් ආරක්ෂක සන්ධානයට හරහට හිටිනු ඇති බවට ය.

දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුව ඕස්ට්‍රේලියාව ආසියා පැසිෆික් කලාපය තුල එක්සත් ජනපදයේ ප්‍රධාන සගයෙකු විය. කෙසේ වුව ද 1970 හා 1980 ගනන්වල එක්සත් ජනපදයේ ආර්ථික එදිරිවාදියෙකු ලෙස ජපානය හිස එසවීම මෙන්ම, වඩා මෑතකදී චීනයේ වේගවත් ආර්ථික නැඟීම ද කැන්බරා ආන්ඩුවට උභතෝකෝටිකයන් මුන ගස්වා තිබේ. එන්ට එන්ටම ආර්ථික වශයෙන් ආසියාව මත රඳපවතින අතර කැන්බරා පාලනය, අනෙක් අතට මූලෝපායිකව එක්සත් ජනපද මිලිටරි සන්ධානය මත යැපෙයි. මෑත පලවූ ආරක්ෂක ධවල පත්‍රිකාවෙන් ඉදිරි 20 වසරක කාලයෙහි එක්සත් ජනපද ආධිපත්‍යයට ඇති ලොකුම තර්ජනය චීනය ලෙස විස්තර කල අතර, රඩ් ආන්ඩුව බීජිං තන්ත්‍රයට සමීප වී ඇති බවට එල්ල වන චෝදනාවලට ඕස්ට්‍රේලියාව මැදිවී සිටියි.

කෙසේ වුව ද චීනය, ඔස්ට්‍රේලියාවේ ලොකුම වෙලඳ හවුල් කරු ය. එරට දැවැන්ත ප්‍රමානයන් ගෙන් ඛනිජ ද්‍රව්‍ය මිලට ගන්නා අතර ම, ඕස්ට්‍රේලියාවේ ප්‍රධාන සංචාරක හා අධ්‍යාපනය සඳහා සිසුන් පැමිනෙන මූලාශ්‍රයක් ද වේ. ඕස්ට්‍රේලියානු වෙලඳ ඇමති සයිමන් ක්‍රියේන්, චිනල්කෝ-රියෝ ගිවිසුම බිඳ වැටුනේ ''ආන්ඩුව හඳුන්වා දුන් තීන්දුවක් මත'' නොවන බව ප්‍රකාශ කරමින්, චීනය අස්වැසීමට උත්සාහ දැරී ය. සැබවින්ම රඩ් ආන්ඩුව, කැන්බරා ව ''ජාතික අවශ්‍යතා'' සැලකිල්ලට ගත යුතුය යන පදනම මත, පෙබරවාරි මාසයේ සිට ම චිනල්කෝ ගිවිසුමට අනුමැතිය දීම ප්‍රමාද කොට තිබේ.

*ෆිනෑන්ෂල් ටයිම්ස්* පුවත්පත මෙසේ විස්තර කලේයඃ ''ආයෝජනය සඳහා සමාලෝචන කාල සීමාව දීර්ග කිරීමට කැන්බරාව ගත් තීරනය මඟින් ජනතා විරෝධය ගොඩනැඟී එම සඳහා කල් ලබාදුනි. අවසානයේ දී භාන්ඩ මිල ගනන් ඉහල නැඟීමේ දීත්, රියෝ හි කොටස් මිල ඉහල යාමේ දීත්, ගිවිසුමෙහි විරුද්ධවාදී අධ්‍යක්ෂ වරුන්ට එය වඩා අඩු වැදගත්කමක් දැරීමට පටන් ගත් අතර ඔවුන්, විශාල චීන සමාගම්

සියල්ල ම මෙන් චිනල්කෝ ද චීන කොමියුනිස්ට් පක්ෂ නායකත්වයට පිලිතුරු සැපයිය යුතව අතැයි යන කාරනය මත අවධානය යොමුකරවී ය. සුලුතර ජාතික පක්ෂයේ සෙනේට් නායක බානබි ජොයිස්, ඕස්ට්‍රේලියාවේ 'ධන මූලාශ්‍රයන්' විදේශ රටක් විසින් පැහැරගෙන ගොස් ඇතැයි රූපවාහිනී ප්‍රචාරක ව්‍යාපාරයක් හමුවේ පෙනීසිටිමින් භීතිය ඇවිස්සීය.''

බීජිනයට එරෙහි ආරක්ෂනවාදී ඝෝෂාව, මූලෝපායික උත්සුකයන් සමඟ වඩාත් සමීපව පිහිටියේ ය. ජපන් ආන්ඩුවේ මඟ පෙන්වීම යටතේ ජපන් සමාගම්, ඕස්ට්‍රේලියානු කැනීම් අංශයෙහි වැදගත් මූලෝපායික ආයෝජන ගනනාවක් ම සිදුකර තිබේ. නිදසුනක් ලෙස, මෙල්බර්න් පදනම් කර ගත් බීඑච්පී මිට්සුබිෂි සන්ධානය වානේ කර්මාන්තය සඳහා ඉන්ධන වශයෙන් ගල් අඟුරු අපනයනය කරන ලොව ප්‍රමුඛයාව සිටියි. ජපානයේ විශාල වානේ සමාගම් දෙකක් වන නිපෝන් වානේ හා ඩේඑෆ්ඊ හොල්ඩිංග්, මෙම වසරේදී සියයට 57 ක මිල කපාහැරීමක් හිමිකර ගත්තේය. ජපානය එක්සත් ජනපදයේ සගයෙකු වීමේ හේතුව මත, මෙම කිසිදු ගිවිසුමක්, ඕස්ට්‍රේලියාවේ ධනය පැහැරගෙන යන්නේය යන විවේචනයට හසු නොවීය.

රියෝ විසින් චිනල්කෝ ප්‍රතික්ෂේප කිරීම, චීන පාලක ප්‍රභූව තුල ඕස්ට්‍රේලියානු විරෝධී මනෝභාවයන්ට තෙල් ඉසිනු ලැබ තිබේ. හොංකොංහි බීජිනයට හිතවත් ෆීනික්ස් රූපවාහිනියේ ප්‍රමුඛ විස්තර කථකයෙකු වන ලියැන්ග්ලියාන් මෙසේ ප්‍රකාශ කරයි. ''සැබවින්ම මා විශ්වාස කරන්නේ, මෙය දේශපාලන තීන්දුවක් බව කිසි විටෙකත් පිලි නොගනු ඇතිමුත් අවසානයේ දී ඕස්ට්‍රේලියානු ආන්ඩුව, ප්‍රධාන භූමිකාවක් ඉටු කර ඇති බවයි. ආන්ඩුව එසේ පිලිගන්නේ නම් එය විශාල කුනාටුවකට හේතුවනු ඇත. එබැවින් ඔවුන් කියන්නේ මෙය හුදෙක් ව්‍යාපාරික තීන්දුවක් පමනක් බවයි.''

තියුනු ආර්ථික පසුබෑමකටත්, නැඟෙන අයවැය හිඟයකටත් මුහුනපා සිටින තතු හමුවේ ඕස්ට්‍රේලියානු විදේශ ආයෝජන සමාලෝචන මන්ඩලය, චීනයේ මින්මෙටල්ස් සමාගමට, කරදරයට පත්ව සිටින ඕස් සමාගම ඩොලර් බිලියන 1.39 කට අත්කර ගැනීමට ඉඩ දුන් ආකාරයට, කුඩා චීන සමාගම්වලට කොල සංඥාව නිකුත් කර තිබේ. කෙසේ වෙතත්, කැන්බරාව එම ගිවිසුමට එකඟ වී ඇත්තේ, දකුනු ඕස්ට්‍රේලියාවේ ප්‍රොමිනන්ට් හිල් හි කැනීම් ව්‍යාපෘතියක්, එය සූක්ෂම මිලිටරි කලාපයට අනවශ්‍ය තරම් සමීපය යන හේතුව මත, අවහිර කිරීමෙන් අනතුරුව ය.

එක දිගට යන ගෝලීය ආර්ථික අර්බුදය මධ්‍යයේ චිනල්කෝ ගිවිසුම බිඳ වැටීම ඇඟවුම් කරන්නේ, වෙලඳපොලවල් හා අමුද්‍රව්‍ය සඳහා ප්‍රධාන බලවතුන් අතර තියුනු වන එදිරිවාදිකම් ය. මෙම මාසයේදී එක්සත් ජනපදය හා යුරෝ සංගමය, චීන සමාගම් වලට ''අසාධාරන වාසි සලසන'' පරිදි සින්ක්, ටින් හා සිලිකන් වැනි ප්‍රධාන රසායන හා ලෝහ ඇතුලු මූලික කාර්මික අමුද්‍රව්‍ය 20 ක් රැස්කරගෙන සිටින්නේ යයි බීජිනයට චෝදනා කරමින්, ලෝක වෙලඳ සංවිධානය වෙත චීනයට විරුද්ධව ඒකාබද්ධ පැමිනිල්ලක් ගොනු කරන්නේ යයි තර්ජනය කර ඇත.

© www.wsws.org